# 40

# ‘සමනල සංධ්වනිය’ හා ‘ඇගේ ඇස අග’යන චිත්‍රපටවලින් ප්‍රේමය පිළිබිඹු කරන ආකාරය පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක්.

*උදයකුමාර, එස්. එම්. කේ. එම්.*[1]

සමකාලීන සිනමා කලාව තුළ ප්‍රේමය තේමා කර ගනිමින් ප්‍රතිනිර්මාණය වූ චිත්‍රපට දෙකක් ලෙස ජයන්ත චන්ද්‍රසිරිගේ ‘සමනල සංධ්වනිය’ (2013) හා අශෝක හඳගමගේ ‘ඇගේ ඇස අග’ (2016) යන චිත්‍රපටයන් හඳුනාගත හැකි ය. පශ්චාත් කාලීන යුද මානසිකත්වයෙන් පිරිහුණු සමාජයක ප්‍රේමය තේමා කොට ගත් ගුණාත්මක ගණයේ නිර්මාණයන් බිහිවීමේ අවශ්‍යතාවක් මතු වී තිබුණි. මෙම චිත්‍රපට සාම්ප්‍රදායික සීමාවෙන් ඔබ්බට ගිය අසම්මතවාදී වූ සමාජ බැඳීම් තුළ සිරගත වූ ප්‍රේමයේ ස්වභාවය පිළිබඳ අවධාරණය කරනු ලබන නිර්මාණයන් ය. ‘සමනල සංධ්වනිය’ චිත්‍රපටයේ දී ගැටවරයෙකු හා බැඳුණු කුල කාන්තාවකගේ ප්‍රේමයක් ඉදිරිපත් කරයි. සංයමය තුළින් ගොඩනැගුණා වූ ආධ්‍යාත්මික ප්‍රේමය සමස්ත ‘සමනල සංධ්වනිය’ සිනමා නිර්මාණයෙහි දිග හැරේ. මෙහි දී වාදීෂ, පූනායා ව මුල් වරට දකින අවස්ථාව හා චිත්‍රපටය අවසානයේ දී ඔහු ඇය ව වැලඳ ගැනීමට උත්සහ දරනු ලබන අවස්ථාවන් ප්‍රේමයේ ආධ්‍යාත්මික භාවයන් උද්දීපනය කරන බව පෙනී යයි. විශ්වවිද්‍යාලයීය ආචාර්යවරයෙකු හට ප්‍රේම කරනා නූතන යථාර්ථවාදී තාරුණ්‍යයේ චෛතසික ස්වභාවයන් හා ඒ හරහා සිදුවන්නා වූ සමාජ ගැටීම් පිළිබඳ ‘ඇගේ ඇස අග’ චිත්‍රපට තුළින් ඉදිරිපත් කරයි. මෙහි දී ආචාර්යවරයා රිතිකාගේ නොපැමිණීම හමුවේ ඇය ව සොයා යෑම හා අවසානයේ දී පන්සල මුල් කොට ගත් සිදුවීම් මාලාව, අසම්මත ප්‍රේමය තුළ සිර වී සිටින පුද්ගල මානසිකත්වය මනා කොට අවධාරණය වන සාධකයන්ගෙන් කිහිපයකි. මේ අනුව පෙනී යන්නේ ‘සමනල සංධ්වනිය’ තුළ දී ප්‍රේමය හා සමාජ බැඳීම් ආධ්‍යාත්මික හා සමාජ සම්මතයන් වටා ගෙතී ඉදිරිපත් කරනා අතර ‘ඇගේ ඇස අග’ චිත්‍රපටය තුළින් ප්‍රේමය වටා ගෙතුණ සමාජ බැඳීම් යථාරූපී භාවයකින් නිරූපණය කරන බවයි.

ප්‍රමුඛ පදඃ සමනල සංධ්වනිය, ඇගේ ඇස අග, අසම්මත, ආධ්‍යාත්මික, යථාර්ථවාදය

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) පළමු වසර. සිංහල අධ්‍යයනාංශය. koshila.madushani11@gmail.com*